# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

| | | | | | |
|---|---|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | | | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk | ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 1482 / 2023 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2023 திகதி | දිනය<br>Date | 29/11/2023<br>පැය 0825 |

# මාධ්‍ය නිවේදනය

## 01. යතුරුපැදි සොරකම් රැසකට සම්බන්ධ සැකකරුවෙකු හෙරොයින් සමඟ අත්අඩංගුවට - බස්නාහිර පළාත දකුණ අපරාධ කොට්ඨාසය.

නුගේගොඩ හා ගල්කිස්ස යන පොලිස් කොට්ඨාසවල සිදුවී ඇති යතුරු පැදි සොරකම් කිරීමේ සිද්ධීන් සම්බන්ධව සැකකරුවන් අත්අඩංගුවට ගැනීම සඳහා බස්නාහිර පළාත දකුණ අපරාධ කොට්ඨාසය මඟින් විමර්ශනයක් ආරම්භකර තිබුණි. ඒ අනුව 2023.11.28 වන දින උදෑසන කාලයේ වැලිකඩ පොලිස් වසමේදී විමර්ශන නිලධාරින්ට ලද තොරතුරකට අනුව මෙම යතුරුපැදි සොරකම් වලට සම්බන්ධ සැකකරුවෙකු හෙරොයින් ග්‍රෑම් 02 මිලිග්‍රෑම් 130 ක් සන්තකයේ තබාගෙන සිටියදී අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 37 ක් වන දෙහිවල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

සැකකරුගෙන් සිදුකල ප්‍රශ්න කිරීම් වලදී හංවැල්ල, කොස්ගම, මොරොන්තුඩුව, වාද්දුව, ජාඇල, කොච්චිකඩේ සහ සීදූව යන ප්‍රදේශවලින් සොරකම් කරන ලද යතුරුපැදි 07 ක් සොයාගෙන ඇත.

බස්නාහිර පළාත දකුණ අපරාධ කොට්ඨාසය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 02. බඹර ප්‍රහාරයකට ලක්ව පාසල් සිසුන් හා ගුරුවරුන් ඇතුළු පිරිසක් රෝහල්ගත කිරීම - බෝයවලාන පොලිස් වසම.

2023.11.28 වන දින උදෑසන කාලයේ බෝයවලාන පොලිස් වසමේ පාසලක සිසුන් පිරිසක් බඹර ප්‍රහාරයකට ලක්ව රෝහල් ගතකර ඇති බවට බෝයවලාන පොලිස් ස්ථානයට ලද පණිවිඩයකට අනුව විමර්ශන ආරම්භ කර ඇත.

පාසල් ඉඩමේ කෙළවර ගසක තිබූ බඹර කූඩුවක් ඇවිස්සීමෙන් බඹර ප්‍රහාරයට ලක්ව පංති කිහිපයක සිසුන් 12 දෙනෙකු හා සිසුවියන් 10 දෙනෙකු ප්‍රතිකාර සඳහා දඹදෙණිය රෝහලට ඇතුළත් කර ඇත. පාසලේ ගුරුවරුන් 05 දෙනෙකු හා අසල

ක්‍රීඩාංගණයක ක්‍රීඩා කරමින් සිටි තරුණයින් සිව්දෙනෙකු ද මෙම බඹර ප්‍රහාරයට ලක්ව ඇති බවට පොලිසිය සිදු කරන ලද විමර්ශනයේදී අනාවරණය වී ඇත.

බඹර කූඩුව එම ස්ථානයෙන් ඉවත් කිරිම සඳහා කුරුණෑගල වනජීවි සංරක්ෂණ නිලධාරින් දැනුවත් කර ඇත. බෝයවලාන පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 03. විදුලි සැර වැදී පුද්ගලයෙකු මියයාම - පදියතලාව පොලිස් වසම.

2023.11.28 වන දින උදෑසන කාලයේ පදියතලාව පොලිස් වසමේ විහාරස්ථානයක විදුලි සැර වැදීමෙන් පුද්ගලයෙකු මියගොස් ඇති බවට පදියතලාව පොලිස් ස්ථානයට ලද පැමිණිල්ලක් මත විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 22 ක් වූ පන්නල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මරණකරු විදුලි ජනක කාර්මිකයෙකු ලෙස කටයුතු කර ඇති බවත් විහාරස්ථානයේ පැවති ආගමික වැඩසටහනක් සඳහා විදුලිය සැපයීම සඳහා පැමිණ එම කටයුතු කරමින් සිටියදී මෙලෙස අනතුරට ලක්ව ඇති බවට පොලිසිය සිදු කරන ලද විමර්ශනයේදී අනාවරණය වී ඇත.

පදියතලාව පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 04. දියේ ගිලී පුද්ගලයෙකු මියයාම - එප්පාවල පොලිස් වසම.

2023.11.28 වන දින උදෑසන කාලයේ එප්පාවල පොලිස් වසමේ කිරිඅමුණුකොළේ පාලම අසල දී ජයගඟට වැටී පුද්ගලයෙකු අතුරුදහන්වී ඇති බවට එප්පාවල පොලිස් ස්ථානයට ලද පැමිණිල්ලක් මත විමර්ශන ආරම්භ කර ඇත. පොලිසිය සිදුකල සොයාබැලීමේදී අතුරුදන්වූ පුද්ගලයාගේ සිරුර කිරිඅමුණුකොළේ වැවෙහි තිබී හමුවී ඇත.

**මියගිය පුද්ගලයා වයස අවුරුදු 53 ක් වූ ඇඳගල, එප්පාවල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෙම පුද්ගලයා කිරිඅමුණුකොළේ පාලම අසල පාලමෙහි එක් රැස්වන කුණු රොඩු ඉවත් කිරීමට යාමේදී ජයගඟට වැටී මෙලෙස අනතුරට පත්ව ඇති බවට අනාවරණය වී ඇත. එප්පාවල පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 05. මාරක රිය අනතුරක් - අතුරුගිරිය පොලිස් වසම.

2023.11.28 වන දින අළුයම් කාලයේ අතුරුගිරිය පොලිස් වසමේ පිටත වටරවුම් අධිවේගී මාර්ගයේදී කෙලවරපිටිය දෙස සිට කොට්ටාව දෙසට ධාවනය වූ ටැංකි ලොරි රථයක් මාර්ගයේ නවතා තිබූ ස්කූටර් රථයක ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් ටැංකි ලොරි රථයේ ගමන් කල කාන්තාවක් හෝමාගම රෝහලට ඇතුලත් කිරීමෙන් පසුව මියගොස් ඇත.

**මරණකාරිය වයස අවුරුදු 39 ක් වූ සෙවණගල ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

මෘත ශරීරය හෝමාගම රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. අනතුරට සම්බන්ධ ටැංකි ලොරි රථයේ රියදුරු අත්අඩංගුවට ගෙන ඇති අතර අතුරුගිරිය පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**06.** **මාරක රිය අනතුරක් - කුට්ටිගල පොලිස් වසම.**

2023.11.28 වන දින රාත්‍රී කාලයේ කුට්ටිගල පොලිස් වසමේ ඇඹිලිපිටිය නෝනාගම මාර්ගයේ කුට්ටිගල ප්‍රදේශයේදී හෝමාගම දෙස සිට ඇඹිලිපිටිය දෙසට ධාවනය වූ යතුරුපැදියක් මාර්ගයේ සිටි ගවයකුගේ ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් යතුරුපැදිකරු හා පසුපැදිකරු බරපතල තුවාල ලබා පදලංගල චන්ද්‍රිකා වැව රෝහලට ඇතුලත් කිරීමේදී පසුපැදිකරු මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 36ක් වූ හාගල, තුංකම ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය පදලංගල චන්ද්‍රිකා වැව රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. අනතුර සම්බන්ධයෙන් කුට්ටිගල පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**